# Rehumanizing the Nation



*Address to the Nation by*

Her Excellency President Chandrika Bandaranaike Kumaratunga

*8th Anniversary of the Presidency*

*12 November 2002*

BKT0236
26/08/2023

**ජනාධිපතිධූරයට පත්වීමේ 8 වන සංවත්සරය නිමිත්තෙන් ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය ජාතිය අමතා පවත්වන කතාව - 2002.11.12**

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

*ගරුතර මහා සංඝරත්නයෙන් අවසරයි,*
*ගෞරවණීය පූජක තුමනි.*
*ආදරණීය මව්වරුනි, පියවරුනි,*
*සහෝදර, සහෝදරියනි,*
*ආදරණීය දරුවනි,*

අදින් අට වසරකට උඩදී ශ්‍රී ලංකාවේ ජනාධිපති ලෙස වැඩ භාරගැනීමේ මාහැඟි වරප්‍රසාදය මට හිමි විය. මගේ රටේ ජනතාව මා වෙත ලබාදුන්නේ අතිවිශාල වූ ජනවරමකි. එය මෙතෙක් ලෝකයේ කවර හෝ රටක තේරී පත් වූ ජනාධිපතිවරයකු විසින් ලබාගන්නා ලද විශාලතම වැඩි ඡන්ද සංඛ්‍යාවන් තුනෙන් එකකි. මෙය මාගේ ජයග්‍රහණයක් පමණක් නොවන බව මම එදා ද දැන සිටියෙමි. මේ වනතුරුත් මට ඒ බව අමතකවී නැත. මෙය ප්‍රජාතන්ත්‍රවාදයේ හා නිදහසේ ජයග්‍රහණයකැයි මම විශ්වාස කරමි. එසේම එය මනුෂ්‍යත්වය, අවංකභාවය, පරිපූර්ණත්වය සහ කාර්යක්ෂමතාව යළි අප රට තුළ සහතික කරන්නාවූ ප්‍රශස්ත හා ශිෂ්ඨ සම්පන්න ආණ්ඩුවක් සඳහා මාගේ සියලු ජනතාව තුළ පැවති අභිප්‍රායේ ජයග්‍රහණයකි.

ජනතාව අපෙන් බලාපොරොත්තු වූයේ සමාජය යළි ගොඩගැනීමේ අති දැවැන්ත වැඩපිළිවෙලක් බව මගේ ආණ්ඩුවත්, මමත් හොඳාකාරවම අවබෝධ කරගෙන සිටියෙමි. අපේ රටේ දේශපාලන, පරිපාලන සහ සමාජ ව්‍යුහයේ පුළුල් හා මූලික වෙනස්කම් හඳුන්වාදීමේ කර්තව්‍යයට උරදීමට අපට සිදුවිය. අපේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ මේ මහා දැවැන්ත කර්තව්‍යයට අප නොබියව මුහුණදෙන බවට අපි ජනතාව හමුවේ ප්‍රතිඥා දුනිමු.

1994 දී මුලින්ම බලයට පත්වී මාසයක් ඇතුළත රාජ්‍ය පාලනය හා ආර්ථික සංවර්ධනය සඳහා අප දර්ශනය මම ඉදිරිපත් කළෙමි.

මුළුමහත් ජනතාව රැකබලා ගැනීමේ කාර්යයට කැපවුණු ප්‍රබුද්ධ ආණ්ඩුවක කර්තව්‍යයන්ගෙන් මෙම දර්ශනය සමන්විත විය. මානවවාදී මුහුණුවරකින් හෙබි නූතන යථාර්තවාදී සහ කාර්යක්ෂම සැබෑවින්ම නිදහස් වූ වෙළඳපොල ආර්ථිකයකට නායකත්වයදීම මෙයින් එක් කර්තව්‍යයක් විය. ජනතාවට සපයන සේවාවන්හි ප්‍රතිලාභ සාධාරණව බෙදීයාම සහතික කරන්නාවූ ද, අත්‍යවශ්‍ය සේවාවන්ගේ සහභාගීත්වය රජය අත් නොහරින්නාවූද විධිවිධාන සහිතව පෞද්ගලික අංශයේ සංවර්ධනයකට ඉඩකඩ ලබාදීම මෙහිදී අත්‍යාවශ්‍ය බව අපි හඳුනා ගත්තෙමු.

ආර්ථික කටයුතුවල නිරතව සිටින සියළු දෙනාගේ දේශපාලන හිතවත්කම් පක්ෂපාතීත්වයන් ගැන සැලකීමකින් තොරව ඔවුන්ට සමාන අවස්ථා සලසාදීම සහතික කෙරෙන නියම නිදහස් වෙළඳපොල ආර්ථිකයක් ක්‍රියාත්මක කිරීම අපේ අරමුණ විය. කාර්යක්ෂම හා බුද්ධිමත් ආණ්ඩුවක අවශ්‍යතාවය ද මේ දර්ශනයේ තවත් අංශයක් විය. මෙම අරමුණ මුදුන්පමුණුවා ගැනීම සඳහා අපි ප්‍රථම වරට නවීන සැළසුම් ක්‍රම ක්‍රියාවට නැංවීමේ වැඩපිළිවෙළක් හඳුන්වා දුනිමු. එසේම දූෂණ අවම කිරීමේ අරමුණින් ටෙන්ඩර් පටිපාටියත් විධිමත් කළෙමු.

ආර්ථිකයට මානවවාදී මුහුණුවරක් යනු සියලුම ජනතාව මනාව රැකබලා ගැනීමය. විශේෂයෙන්ම, අඩු වරප්‍රසාද සහිත ජනතාව රැකබලා ගැනීමය. ඌණ සංවර්ධනයේ සිට සංවර්ධනය කරා යන ගමනේ අතර මැදි යුගයේදී අයුහවාදී ආර්ථික බලපෑම් වලින් දිළිඳු ජන කොටස් ආරක්ෂා කිරීම සඳහා ක්‍රම න්‍යාය සකස් කළ යුතුවේ. මෙම ආධාර සැළසුම් කර තිබුණේ නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදාව වැඩිවන ආකාරයටයි.

රටේ සංවර්ධනය සඳහා වන මගේ දර්ශනය ජීවිතය පිළිබඳ මගේ දර්ශනය සමග වෙන්නොකළ හැකි අයුරින් බැඳී පවතී. මනාප්වන දර්ශනයක්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

නොමැතිව රට පිළිබඳ දර්ශනයක් ක්‍රියාත්මක කළ නොහැකියැයි මම විශ්වාස කරමි. පෞද්ගලික බේදවාචක ඉමහත් බාධක, නින්දා හා අසත්‍ය ප්‍රචාර මධ්‍යයේ පවා මෙම දර්ශනය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ධෛර්යය, ශක්තිය හා ඇපකැපවීම ලබාදුන් අධ්‍යාත්මික හා සදාචාරාත්මක හර වටිනාකම් මට උරුම වූයේ මා ලැබූ අධ්‍යාපනයෙනි. ඊටත් වඩා වඩා මගේ දෙමව්පියන්ගෙනි.

- ජාතියට සේවය කිරීමේ පූර්ණ කැපවීම.
- අවංකභාවය පරිපූර්ණත්වය හා වෙහෙස මහන්සියෙන් වැඩකිරීම.
- මගේ මිතුරන් හා මගේ සගයින් කෙරෙහි පක්ෂපාතිත්වයෙන් යුතුව හා ඔවුන් කෙරෙහි මනාලෙස සැළකිලිමත්වීම.

මේ චර්යාධර්ම මගේ ආගමයි. ඒවා මගේ ජීවිතය සමඟ වෙන්කළ නොහැකි අයුරින් බැඳී පවතී. ඒවා අන්කිසිවෙකුට හෝ අන්කිසිදේකට වඩා මාගේ ජීවිත ගමන පෝෂණය කර ඇත.

<u>*ශ්‍රී ලංකාව සඳහා අපගේ දර්ශනය ප්‍රධාන අරමුණු කිහිපයකට බෙදා වෙන්කළ හැකිය. මේ අරමුණ මෙසේය ,*</u>

1. ***ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රය සහ මිනිසත් බව යළි රජකරවීම.***

    ප්‍රජාතන්ත්‍රවාදී විරුද්ධවාදීන්ට සහ රට වැසියන්ට එරෙහිව යෙදවූ රාජ්‍ය ත්‍රස්තවාදය 1994 දී නතර කළා පමණක් නොව අනාගතයේ දී එවැනි තත්ත්වයක් යළි ඇතිවීම වළක්වාලීම සඳහා නව නීති ද සම්පාදනය කෙරුණි. අදාළ පරීක්ෂණ කටයුතු ඉතාමත් නීත්‍යානුකූලව සිදු කෙරුණු අතර විපතට පත්වූවනට වන්දි ලබාදෙනු ලැබීය. අසත්‍ය ලද චෝදනා මඟින් විරුද්ධවාදීන් බියගැන්වීම සඳහා කිසිම අවස්ථාවක නීතිය හෝ පොලීසිය අයුතු ලෙස යොදා ගනු නොලැබීය. ස්වකීය වැඩකටයුතු නිසි ලෙස ගෙනයාමට හැකිවන පරිදි අධිකරණය නැවත වරක් ස්වාධීන කෙරුණි. ඍජු හා

චක්‍රාකාරයෙන් පැවති සියලු ආකාරයේ මාධ්‍ය වාරණ ඉවත් කරනු ලැබීය.

2. *ආර්ථිකය*

බරපතල ආබාධයන්ට ලක්ව තිබූ ආර්ථිකයක් පුනරුත්ථාපනය කිරීමේ භාරදූර කාර්යයට උරදෙන්නට අපට සිදුවිය.

- උද්ධමනය, අයවැය පරතරය, බැංකු පොලී අනුපාතය හා විරැකියාව අතිශයින් ඉහළ මට්ටමක පැවතුණි.
- වැටුප් හා ජාතික ඉතිරි කිරීම් ඉතාම පහළ මට්ටමක පැවති අතර, මිළදී ගැනීමේ ශක්තිය අසතුටුදායක විය.
- ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන මට්ටම ඉතාමත් පහළ ගොස් තිබූ අතර කෘෂිකාර්මික සංවර්ධනය එක තැන පල්වෙමින් තිබුණි.
- අවිධිමත් ලෙස පෞද්ගලීකරණයට ලක්වී තිබූ රාජ්‍ය කර්මාන්ත ගණනාවක් මෙන්ම පෞද්ගලීකරණය කර තිබූ වතු ද, බරපතල පාඩු පිට පවත්වාගෙන යනු ලැබීය. මේවායේ කළමනාකරණය ඉතාමත් නරක තත්ත්වයක පැවති අතර, ඒවා රජයට බරක් විය.

ඉතා විශාල වශයෙන් වැඩිවන යුද වියදම් මධ්‍යයේ පවා අයවැය පරතරය අඩුකිරීමට අපි ක්ෂණික පියවර ගත්තෙමු.

- උද්ධමනය හා විරැකියාව පාලනය කෙරුණි.
- 1994 සිට වසර 2001 මුල්භාගය දක්වා සියයට පහමාරක සාමාන්‍ය ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන ගිය අතර බැංකු පොලී අනුපාතය විශාල වශයෙන් අඩු කෙරුණි.
- පෞද්ගලීකරණය කළ ව්‍යාපාර සහ වතුකරය වඩාත් කාර්යක්ෂම, විනිවිද සහ අවංකභාවයකින් යුතුව, බෙහෙවින් සාර්ථක ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට අපට හැකිවිය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

- වැටුප් දෙගුණ කෙරුණි. ඇතැම් අවස්ථාවල තෙගුණ කෙරුණි. විශ්‍රාම වැටුප් වැඩි කෙරුණි.
- රජයේ සේවකයින් සඳහා අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ආරම්භ කෙරුණි.

අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එනම් සමාජ යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ මූලික ව්‍යුහාත්මක වෙනස්කම් සහ සංවර්ධනයත් මෙන්ම ග්‍රාමීය යටිතල පහසුකම් ද වේගවත් ලෙස සංවර්ධනය කිරීම අපේ අරමුණ විය. 1994 ට කලින් දශකයේ ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතුවලට වඩා හයගුණයක් පමණ වූ සංවර්ධන කටයුතු නිම කරමින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ පුළුල් වැඩපිළිවෙළක් අපි ක්‍රියාත්මක කළෙමු.

- 32% සිට 55% දක්වා විදුලිබල සැපයුම වැඩි කෙරුණි.
- විදුලි සංදේශ සැපයුම හතර ගුණයකින් වැඩිවිය.
- අඩු ආදායම් ලබන ජනතාව සඳහා පානීය ජල සැපයුම විශාල වශයෙන් වැඩි කෙරුණි.
- නිදහසින් පසු ප්‍රථම වරට නාගරික සංවර්ධන සැළසුම් සකස් කෙරුණු අතර ඒවා නගර ගණනාවක ක්‍රියාත්මක කෙරුණි.
- නවීන හා කාර්යක්ෂම අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කෙරුණ අතර එය ක්‍රියාත්මක වෙමින් පැවතුනි.
- රාජ්‍ය සෞඛ්‍ය අංශයේ ප්‍රතිසංවිධානය කටයුතු ආරම්භ විය.
- වතුකරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ප්‍රථම වරට රජය මගින් ආරම්භ කරනු ලැබීය.
- වතුසමාගම් මගින් පාලනය කරනු ලැබූ දුර්වල තත්ත්වයක පැවති පාසල්, රෝහල් සහ මාර්ග රජයට පවරාගෙන වැඩිදියුණු කරනු ලැබීය. මේවා ක්‍රියාත්මක වූයේ වතුකරය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශාල වැඩපිළිවෙළක් යටතේය. වතුකම්කරුවන් සඳහා පානීය ජලය

ඇතුළු නිවාස පහසුකම් ලබාදීම ද මේ වැඩපිළිවෙළට අයත් විය.

- යුද ගිනි ඇවිලී තිබූ උතුරු නැගෙනහිර ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය 1996 සිට ආරම්භ විය.. වසර 2000 වනවිට මගේ ආණ්ඩුව උතුරු නැගෙනහිර සඳහාවූ සහන සැලසීම, යළිපදිංචි කරවීම සහ පුනරුත්ථාපනය යන ත්‍රිත්ව වැඩපිළිවෙළ පිළිබඳව සාකච්ඡා සාර්ථක ලෙස නිමකරමින් ආධාර දෙන රටවලින් හා ජාත්‍යන්තර ආයතනවලින් විශාල වශයෙන් ආධාර ලබාගැනීමට ගිවිසගෙන වැඩ ආරම්භ කරන ලදී.

1. <u>කෘෂිකාර්මික අංශය.</u>

සියලු අංශවල සහභාගීත්වයෙන් නව කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් අපි සකස් කළෙමු. එහි ප්‍රධාන අංග ලක්ෂණ මෙසේය,

- ගොවිජනතාවගේ ආදායම් වැඩිකිරීමේ අරමුණ පෙරදැරිව නිෂ්පාදනය නවීකරණය කරමින් හා වර්ධනය කරමින්ද නව වෙළඳපළ ක්‍රම හඳුන්වාදෙමින් ද, කුඩා ගොවි නිෂ්පාදනය ශක්තිමත් කිරීම.
- විදේශ වෙළඳපොළ සඳහා විශාල කෘෂිකාර්මික නිෂ්පාදන ඒකක සංවර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයින් දිරිගැන්වීම. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1994 දී මා බලයට පත්වීමෙන් පසුව කෘෂිකාර්මික අංශයේ වර්ධනයක් ඇතිවිය.
- වතුකරය නවීකරණය කිරීම සහ එහි නිෂ්පාදන ඵලදාව වැඩිකිරීම.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## 2. කාර්මික අංශය

මෙම ක්ෂේත්‍රයේ අපේ ප්‍රතිපත්තිය වූයේ, විශාල කර්මාන්තවලට විදේශ ප්‍රාග්ධනය හා තාක්ෂණය ගලා ඒමට දිරිදෙන අතර, සුළු හා මධ්‍යම මට්ටමේ කර්මාන්ත අංශයේ දේශීය කර්මාන්ත නංවාලීමයි. මෙහිදී ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය ඉතාමත් අඩු මට්ටමක පැවති බව සැලකිල්ලට ගැනීමට අපට සිදුවිය.

මෙම ප්‍රතිපත්තිය හේතුකොට ගෙන 1994 න් පසු 6 වසරක කාල පරිච්ඡේදය තුළදී කාර්මික අංශයේ සැලකිය යුතු වර්ධනයක් ඇතිවිය. ඒ වනතුරු නොසලකා හැර තිබූ සුළු කර්මාන්ත සහ අත් කර්මාන්ත අංශය වර්ධනය කිරීමට අපි විශේෂ අවධානය යොමු කළෙමු.

ආසියාවේ ප්‍රධානතම මූල්‍ය හා සේවා මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේ දර්ශනයක් ද අපට විය. මේ අනුව ඉතිහාසයේ ප්‍රථම වරට කොළඹ වරාය සහ ජාතික ගුවන් සේවාව සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශය සහභාගී කරවාගනු ලැබීය. මෙය සිදු කළේ ආණ්ඩුවට ඉතාමත් වාසිදායක කොන්දේසි යටතේය. ඉදිකොට ගොඩනගා අයිතිය පැවරීමේ Boot Bot යෝජනා ක්‍රම මගින් විදුලිබල හා විදුලි සංදේශ අංශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙම අංශවල රජය සතු ව්‍යාපාරවල කොටස් සුළුතරයක් පෞද්ගලීකරණය තුළින් , පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබාගනු ලැබීය. අවිධිමත් ලෙස ගනු ලැබූ තීරණ මත ව්‍යාපාර පෞද්ගලීකරණය කිරීමේ වැඩපිළිවෙළ සහමුලින් නතරකරනු ලැබූ අතර පෞද්ගලීකරණය මෙහෙයවීම සඳහා ව්‍යාවස්ථාපිත මණ්ඩලයක් පිහිටුවනු ලැබීය. 1994 - 2001 කාල පරිච්ඡේදය තුළදී සිදු කෙරුණු සෑම පෞද්ගලීකරණ වැඩපිළිවෙළක්ම කාර්යක්ෂමතාව හා ලාභදායකත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් ඉතාමත් විවෘත භාවයෙන් යුතුව සිදුකළ බව ආඩම්බරයෙන් යුතුව මට ප්‍රකාශ කළ හැකිය. මේවායේ අපේක්ෂිත අරමුණු සියල්ලක්ම මුදුන් පමුණුවා ගත හැකි විය.

## 3. ප්‍රසස්ථ පාලනය.

සීඝ්‍ර සමාජ ආර්ථික වෙනස්කම්වලට අනුකූලව වෙනස්වීමට සහ සකස්වීමට හැකියාව ඇති රාජ්‍ය පාලනයක් හා පරිපාලනයක් අපේ ආර්ථිකයට අවශ්‍යය. වඩාත් වැඩි වටිනාකමක් ගෙනදෙන අයුරින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමටත්, ජනතාවගේ ජීවිතය වඩාත් පහසු කිරීමටත්, හැකිවන අයුරින් පරිපාලන ව්‍යුහයේ වෙනස්කම් ඇති කිරීම අත්‍යාවශ්‍ය විය. පරිපාලන අංශයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ සම්පූර්ණ වශයෙන් යොදා ගැනීම අවශ්‍ය විය. පරිගණක කටයුතු වලදී රාජ්‍ය අංශයට පෞද්ගලික අංශය සමග සමාන මට්ටමින් තරගකළ නොහැකි විය. විද්‍යුත් පාලනය e- governance ක්‍රියාත්මක කිරීමත් සමග ඒ පරතරය සීඝ්‍රයෙන් පියවිය යුතුව තිබුණි. අප මේ ක්‍රියාදාමය ආරම්භ කළ බවත්, එයින් සැහෙන ප්‍රගතියක් අත්කර ගත් බවත් ප්‍රකාශ කිරීමට මම සතුටු වෙමි.

කෙසේ වුවද ප්‍රශස්ත පාලනයේ හරය වන්නේ රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව හා ඵලදායකත්වයයි. අපේ උසස් අධ්‍යාපන ක්‍රමයෙන් බිහිවූ දීප්තිමත් හා හොඳම පුද්ගලයින්ගේ සේවය අපේ රාජ්‍ය සේවයට ලැබුණි. රටේ සංවර්ධනය සඳහා මොවුන්ගේ හැකියාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගතයුතුය. රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම අවශ්‍යය. මෙහිදී රාජ්‍ය සේවයේ නිරතවූවන්ට වැඩි වැටුප් ලබාදීමත්, කාර්ය සාධනය පදනම් කරගත් දිරිදීම් ලබාදීමත්, ක්‍රම හා ක්‍රියාදාමයන් විධිමත් කිරීම තුළින් කාර්යක්ෂමතාව සහතික කිරීමත් අවශ්‍ය වන්නේය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## 4. යුද්ධය හා සාමය.

අපේ ජාතියේ ඉදිරි ගමනට හරස් වූයේ වාර්ගික ප්‍රශ්නය බව මා අමුතුවෙන් කිවයුතු නැත. මෙම ප්‍රශ්නය විසඳන ආකාරය ගැන මගේ දැක්ම ගතවූ දශක දෙක තුළදී මා දීර්ඝ වශයෙන් හා පැහැදිලි වශයෙන් ප්‍රකාශ කොට ඇත. නිදහසින් පසුව වාර්ගික ප්‍රශ්නය විසඳීමේ පැහැදිලි ප්‍රතිපත්තියක් නිදහසින් පසු ප්‍රථම වරට ඉදිරිපත් කළේ මගේ පළමු රජයයි. ඒ වනවිට සාමය යන වචනය දේශපාලන ශබ්ද කෝෂයට පවා ඇතුළත්වී තිබුනේ නැත. එම කාල පරිච්ජේදයේදී දිවයිනේ නගර ගම් නියම්ගම් කරා යමින් අපි පුළුල් සාමවැඩ පිළිවෙළක් ආරම්භ කළෙමු.

1983 සිට වාර්ගික ප්‍රචණ්ඩත්වයට විශාල වශයෙන් හේතු සාධක වූයේ 70 දශකයේ අගභාගයේ සිට ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සීඝ්‍රයෙන් අහෝසිවී යාමත්, ආණ්ඩුව ඒකාධිපතිත්වයකට මුල පිරීමත් නිසා බව අප පිළිගතයුතුව තිබේ. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ශක්තිමත් කිරීම වාර්ගික ප්‍රශ්නය විසඳීමේ වැදගත් අංශයක් විය. ගැඹුරු ලෙස බෙදීගිය අප සමාජයේ වාර්ගික සමගිය, සමාදානය යළි ඇති කිරීම සඳහා අත්‍යාවශ්‍ය කාරණයක් වන්නේ ජාතිය ගොඩනැගීමට අප අපොහොසත්වූ බව අවංකව පිළිගැනීමයි.

මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා පසුගිය දශක කීපය තුළදී ඇතිවූ වාර්ගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා මම ජනාධිපති සත්‍ය කොමිසමක් පත් කළෙමි. 1983 ජූලි මාසයේදී සාමාන්‍ය දෙමළ ජනතාව ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රාජ්‍යයට පැහැදිලිවම නොහැකිවීම වාර්ගික සම්බන්ධතා බිඳවැටීමට බලපෑ ප්‍රධාන හේතුව විය. එය අපේ ඉතිහාසයේ මහා ජාතික ඛේදවාචකයකි. මේ තත්ත්වය ගැන මම දැඩි ලෙස කණගාටු වෙමි.

## 5. අනාගතය සඳහා මගේ දර්ශනය

21 වැනි ශතවර්ෂය සඳහා අප දර්ශනය ලෙස අපගේ නව දර්ශනය වසර 2000 දී මම ප්‍රකාශයට පත්කළෙමි. මෙම දර්ශනයට ක්‍රියාවට නැඟීම 2001 වසරේදී ආරම්භ වීමට නියමිතව තිබුණි. බලාපොරොත්තු නොවූ ජාතික ආපදා කිහිපයක් සහ ලෝක ආර්ථික අහේතිය හේතුකොට ගෙන ඇතිවූ ආර්ථික පසුබෑමත්, ඉන්පසුව ඇතිවූ ආණ්ඩු වෙනසත් නිසා මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇනහිටියේය.

මාගේ ජනාධිපති ධූරයේ නව වැනි වසර ආරම්භ කෙරෙන මෙම අවස්ථාව ඉදිරි දශක සඳහා රාජ්‍ය පාලනය පිළිබඳවත්, සංවර්ධනය පිළිබඳවත් මාගේ දර්ශනය ඉදිරිපත් කිරීමට අවස්ථාව කරගනිමි.

1. මෙම දර්ශනයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ශ්‍රී ලංකාවේ නැවත වරක් **ප්‍රජාතන්ත්‍රවාදය හා මිනිසත්බව යළි රජකරවීමේ** කාර්යයට උරදීමයි. **සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන හා ආර්ථික වැඩපිළිවෙළක්** ක්‍රියාත්මක කිරීම ඊට ඇතුළත්ය. 1994 දී අප ජනතාව සමඟ එළඹ ගත් සමාජ සම්මුතියෙන් අපි තවමත් බැඳී සිටිමු.

   මේ සඳහා රාජ්‍ය පරිපාලනය ශක්තිමත් කර පක්ෂග්‍රාහීත්වයෙන් තොරව නිදහසේ ක්‍රියාත්මකරවීමේ හැකියාව සහතික කිරීම සඳහා ආණ්ඩුවේ මට්ටමින් උත්සාහ දැරීම අවශ්‍යය. මේ සඳහා අනිසි දේශපාලන බලපෑම් ඉවත් කළයුතුය.

   අධිකරණය හා ව්‍යවස්ථාදායකය සහ පොලීසිය දේශපාලන පළිගැනීම්වලට හසුවීමේ බියෙන් මෙන්ම අනවශ්‍ය බලපෑම් වලට දූෂණයට ඇති ඉඩකඩවලින් ද තොරවිය යුතුය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ස්වාධීන කොමිෂන් සභා එක් දේශපාලන කණ්ඩායමකට විරුද්ධවූ තවත් දේශපාලන කණ්ඩායමකට පක්ෂග්‍රාහී පුද්ගලයින්ගෙන් සමන්විත වන්නේ නම් මේ කොමිසන් සභාවල අරමුණු සාර්ථක ලෙස මුදුන් පමුණුවා ගතහැකි යැයි මා විශ්වාස කරන්නේ නැත.

දශකයක කාලයක් මේ රටේ ආණ්ඩු කිරීමේ කටයුතුවලට සහභාගිවීමෙන් ලබා ඇති අත්දැකීම් අනුව ඉතා අවංක ලෙස මා විශ්වාස කරන කාරණය නම් මේ රටේ දේශපාලන රටාව සම්පූර්ණයෙන්ම පිරිසිදු විය යුතු බවයි. මහජන නියෝජිතයින්ට අඩුම වශයෙන් අවංකභාවය හා ජාතියේ අවශ්‍යතාවලට ඇපකැපවීමේ මූලික ගුණාංගවත් තිබීම අප සහතික කළ යුතුය. මිට දශකයට උඩදී තරම් මෑත කාලයකදී ස්වකීය ප්‍රජාතන්ත්‍රවාදී විරුද්ධවාදීන් ඝාතනය කිරීමටත්, ඔවුන්ට විවිධාකාරයේ ශාරීරික හිරිහැර කිරීමටත් නියෝග කළ ඇතැම් දේශපාලන නායකයින් සිටි රටක, මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය ධර්ම උල්ලංඝනය කළ බවට සැහෙන සැකයක් ඇති පුද්ගලයින් ව්‍යවස්ථාදායකයේ හා පරිපාලනයේ ඉහළ තනතුරු දැරීමෙන් ඈත්වී සිටීමේ තත්ත්වයක් අප සහතික කළයුතුය. එසේම දූෂණය පිළිබඳ සැකයට භාජනයවූ සහ අයහපත් රාජ්‍ය පාලන පිළිබඳ ඉතිහාසයක් ඇති පුද්ගලයින් ද, එසේම ඈත්කර තැබිය යුතුය. හුදෙක් සුහදතාව පලකරනු ලබන ප්‍රකාශවලින් පමණක් අපට සෑහීමට පත්විය නොහැකි බව ඉතිහාසය ඔප්පු කොට තිබේ.

ආණ්ඩුවේ සෑම මට්ටමකම ව්‍යවස්ථාදායක සහ පාලන මණ්ඩලවලත් සංයුතිය සහ ක්‍රියාකාරීත්වය මෙම අරමුණු මුදුන්පමුණුවා ගැනීමට හැකිවන අයුරින් සකස් කර ගැනීම සඳහා සුදුසුයැයි හැඟෙන නව ක්‍රම, ව්‍යුහයන්, ආයතන හා

විධික්‍රම අප නිර්මාණය කළයුතුය. මේ සඳහා දේශපාලන නායකයින් සහ සමාජ හා ජනමත ප්‍රධානීන් සමඟ පුළුල් ලෙස අදහස් හුවමාරු කරගැනීම පිණිස අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රශස්ත පාලනය සඳහා ජාතික කමිටුවක් පුළුල් බලතල සහිතව පිහිටුවීමට මම යෝජනා කරමි.

බහුපක්ෂ නියෝජිතයන්ගෙන් ද, රාජ්‍ය සේවයේ හා පෞද්ගලික අංශයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ගෙන් ද, රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන්ගෙන් ද මෙම කමිටුව සමන්විත විය යුතුය. දූෂණය අවම කරන අතර, රාජ්‍ය සේවයේ උසස් කර්යක්ෂම තත්ත්වයන් මුදුන්පමුණුවා ගැනීම සඳහා 1994 සිට ක්‍රියාත්මක කළ ප්‍රශස්ත පාලනය පිළිබඳ ප්‍රතිපත්ති තවදුරටත් ශක්තිමත් කොට ක්‍රියාත්මක කළයුතුයැයි මම යෝජනා කරමි. පරිපාලන ව්‍යුහයන් වඩාත් පුළුල් අයුරින් විමසුමට ලක්කළ යුතුය. නව ක්‍රම හා විධික්‍රම සකස් කොට ක්‍රියාත්මක කළ යුතුය.

2. **දෙවනුව ආර්ථිකය හා සංවර්ධනය සම්බන්ධයෙන් මා කලින්ද සඳහන් කළ පරිදි අපේ කැපවීම වන්නේ මානවවාදී මුහුණුවරක් සහිත නිදහස් වෙළඳපොල ආර්ථිකයකට මඟ පාදන්නාවූ වූ සාමජ ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙලකි.** වෙළඳ පොල ආර්ථික පසුබිමක් තුළ අපි ආර්ථිකයේ තිරසාර සංවර්ධනයක් සඳහා ශ්‍රී ලාංකික ආර්ථිකය ඉටුකළ යුතු අරමුණු ගණනාවක් තිබේ.

- ආර්ථිකයේ පදනම ශක්තිමත් කිරීම, අයවැය පරතර හා උද්ධමනය අඩුකිරීම සහ එමගින් බැංකු පොලී අනුපාතය අඩු කිරීම

- 2003 වසර වනවිට අඩු වශයෙන් සියයට 6 ක වාර්ෂික වර්ධන වේගයක් ළඟාකර ගැනීම සහ වසර තුනකට පසුව එය සියයට 8 දක්වා වැඩි කිරීම.
- 2003 අවසන් වන විට අළුත් රැකියා 50,000 ක් නිර්මාණය කිරීම සහ ඉන් අනතුරුව එළඹෙන වසර තුන තුළදී වර්ෂයකට ලක්ෂය බැගින් රැකියා සංඛ්‍යාව වැඩිකිරීම.
- වැටුප් කොමිසම මගින් නිර්දේශ කරන ලද රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීම වලින් සියයට පණහක් 2003 දී ලබාදීම සහ ඉතිරි සියයට පණහ 2004 දී ලබාදීම .
- සුළු කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීම හා නඟා සිටුවීම මගින් කෘෂිකාර්මික අංශය ශක්තිමත් කිරීම.මේ සඳහා නූතන තාක්ෂණය හඳුන්වාදීම, වඩා හොඳ කළමනාකරණය සහ වෙළඳ පොළ වැනි හඳුනාගත් විශේෂිත අංශ ඉලක්ක කර ගනිමින් අඩු පොළී ණය පහසුකම් සළසාදීම.
- මධ්‍යම හා සුළු කර්මාන්ත හා අත්කම් අංශය මෙන්ම සුළු ව්‍යාපාර ද වහාම දිරි ගැන්විය යුතුය. පහසු ගෙවීමේ කොන්දේසි යටතේ ණය පහසුකම් ලබාදීමෙන් මෙම අංශයට ද සෙත සැළසිය හැකිය.
- සුළු කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශවලට සමෘද්ධි ප්‍රතිලාභීන් යොමුකළ යුතුය.
- සුළු ගොවි කෘෂිකාර්මික අංශය මෙන්ම සුළු හා මධ්‍යම පරිමාණ කාර්මික අංශය වර්ධනය කිරීමේ ප්‍රතිපත්තියේ අරමුණ විය යුත්තේ **ජනතාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමයි.**

## පෞද්ගලීකකරණය

මීට කලින් අවස්ථාවකදීද මා ප්‍රකාශ කර ඇති පරිදි ක්ෂණික සංවර්ධනය හා දරිද්‍රතාවය පිටුදකින බවට ඉදිරිපත් කල පොරොන්දුව ඉටු කිරීමට ගෝලීයකරණය අපොහොසත්වී ඇත. ජාත්‍යන්තර ආයතන මගින් දෙනු ලබන ගෝලීයකරණ වට්ටෝරුව සළකා බැලිය යුත්තේ අපගේම අත්දැකීම් මෙන්ම අපගේ අවශ්‍යතාවන් හා හැකියාවන් පිළිබඳ නිවැරදි අවබෝධයෙන් යුතුවය.

පෞද්ගලීකකරණය පිළිබඳ අපේ ප්‍රතිපත්තිය ආරම්භයේ සිටම ඉතාමත් පැහැදිළි විය. කොටස් අළෙවි කිරීමෙන් හා රජය සමග ඒකාබද්ධ කලමනාකරණය සහිත පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබා ගැනීමෙන් වරාය, ගුවන් සේවා, විදුලි සංදේශ හා විදුලිබල යන ඇතැම් අත්‍යාවශ්‍ය සේවාවන් කාර්යක්ෂම හා ඵලදායී කරගත හැකිය. ප්‍රධාන රාජ්‍ය බැංකු, රක්ෂණ සංස්ථා සහ පොදු ප්‍රවාහන සේවා රජය යටතේම පැවතිය යුතු අතර මේවායේ කාර්යක්ෂමතාව නිෂ්පාදන ඵලදාව හා ලාභ දායකත්වය වැඩිකිරීමේ අරමුණින් මෙම ආයතනවල කලමනාකරණය පුළුල් ප්‍රතිව්‍යුහගතකරණයකට ලක්කළ යුතුය. මීට වසර කිහිපයකට උඩදී මා විසින් ආරම්භ කරණ ලද ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක ප්‍රතිව්‍යුහගතකිරීමේ කටයුතු සතුටුදායක ප්‍රගතියක් පෙන්වා ඇත. අනෙකුත් ආයතන සඳහාද ආණ්ඩුවට මෙවැනි ප්‍රතිව්‍යහුගත වැඩ පිළිවලක් ආරම්භ කළහැකිය.

ඉහතින් සඳහන් කල සංකල්ප මත පදනම්වූ නව ආර්ථික වැඩ පිළිවෙළක් රටට ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙමි. 2001 දී අනපේක්ෂිත ජාතික හා අන්තර් ජාතික ව්‍යාකුලත්වයක් නිසා මද පසුබෑමක් ඇතිවූවත් 1994 සිට 2001 මැද දක්වා සාර්ථකව ක්‍රියාත්මකවූ ආර්ථික සැලැස්ම එමගින් වඩාත් කාර්යක්ෂම හා කඩිනම් ලෙස ඉදිරියට ගෙනයා හැකිවනු ඇත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## 3. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයට අදාල මූලික ප්‍රශ්න පැනනැගී ඇත්තේ 1978 ව්‍යවස්ථාවෙන් නිර්මාණය කරණ ලද අළුත් විධිවිධාන නිසා බව අපි දනිමු. එම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදෙන ලද මැතිවරණ ක්‍රමය නිසා දුර්වල ආණ්ඩු බිහිවිය. විශාල ජනවරමක් සහිතව පාර්ලිමේන්තුවට තේරී පත්වූ දේශපාලන පක්ෂවලට පාර්ලිමේන්තුව තුළ අවසානයේ හිමිවන්නේ සුළු වැඩි ඡන්ද සංඛ්‍යාවකි. මෙනිසා රටේ දීර්ඝකාලීන අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා ස්වකීය ජනවරම කාර්යක්ෂමව හා ප්‍රබල ලෙස ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවලට නොහැකි විය. උදාහරණයක් දැක්වුවහොත් 1994 දී පොදුජන එක්සත් පෙරමුණ රටේ ඡන්ද කොට්ඨාශවලින් සියයට 80 කට වැඩි සංඛ්‍යාවක් දිනා ගනිමින් ද ජනාධිපතිනිය සියයට 63 කට ආසන්න ජනතා ඡන්දයක් දිනා ගනිමින්ද බලයට පත්වූ නමුදු පාර්ලිමේන්තුව තුළ එම පක්ෂයට හිමිවූයේ එක් වැඩි ඡන්දයක් පමණි. මෙය වර්තමාන ආණඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදෙන ලද අරුම පුදුම මැතිවරණ ක්‍රමයේ ප්‍රතිඵලයකි.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කෙරුණු විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ සංකල්පයට මම හැමවිටම විරුද්ධවීමි. ජනාධිපතිට පවරා ඇති අධික බලතල අතිශයින්ම අනතුරුදායකය. ආඥාදායක අපේක්ෂාවන් සහිත පුද්ගලයෙකු ජනාධිපතිධූරයට පත්වුවහොත් මේ බලතල වලින් ප්‍රජාතන්ත්‍රයට හා නිදහසට මාරාන්තික තර්ජනයක් වනු ඇත.

එබැවින් විධායක ජනාධිපතිධූරය අහෝසි කරන ලෙසත්, වත්මන් මැතිවරණ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී හා වඩාත් යථාර්තවාදී ක්‍රමයක් බවට පත් කරන ලෙසත් මම නැවත වරක් යෝජනා කරමි. නව මැතිවරණ ක්‍රමය මගින් ජනතාවගේ වරම නිසි පරිදි පිළිබිඹු වියයුතු

අතරම එමගින් සුළු ජනතාවගේ අපේක්ෂාවන් ද ආරක්ෂා වියයුතුය. කේවල ජන්ද ක්‍රමය සහ සමානුපාතික ජන්ද ක්‍රමයේ මිශ්‍රණයක් මේ සඳහා යෝජනා කරමි. එවැනි ක්‍රමයක් පිළිබඳ විස්තර දැනටමත් සකස්කර ඇති අතර පාර්ලිමේන්තු කමිටුවක එය සාකච්ජාවට ලක්වී ඇත. මේ නව මැතිවරණ ක්‍රමය ඊළඟ මහා මැතිවරණයේ සිට ක්‍රියාත්මක කළහැකිය.

සුළු ජනකොටස්වල අයිතිවාසිකම් තවදුරටත් සහතික විය යුතුය. මගේ ආණ්ඩුව මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 1997 සහ 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් වල පදනම මත පිහිටා පුළුල් ලෙස දේශපාලන හා පරිපාලන බලතල බෙදාදිය යුතුය.

17 වැනි ව්‍යවස්ථා සංශෝධනය යටතේ යෝජිත ස්වාධීන කොමිසන් සභා පූර්ණ හා නියි ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කළයුතුය.

දේශපාලන පළිගැනීම වළක්වාලන ස්වාධීන කමිටුවක් ද පිහිටුවිය යුතු යැයි මම යෝජනා කරමි. අතීතයේදී ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදුනු අයට දඬුවම් නිර්දේශ කිරීම මේ කමිටුවට පැවරිය යුතුය. එසේම අනාගතයේදී එවැනි සිදුවීම් ඇතිවීම වැළැක්වීමටද තුඩුදෙන අයුරින් එය ක්‍රියාත්මක කළයුතුය.

මාධ්‍ය නිදහස සහතික කරන, එමෙන්ම දේශපාලන විරුද්ධවාදීන්ට තර්ජනය කිරීම හා හිරිහැර කිරීම පිණිස බලයේ සිටින ආණ්ඩුව මාධ්‍ය අයුතු ලෙස පාවිච්චි කිරීම වළක්වාලන ස්වාධීන මාධ්‍ය කොමිසමක් පිහිටුවිය යුතුයැයි ද මම යෝජනා කරමි.

## 4. වාර්ගික සමගිය සහ තිරසාර සාමය

මෙයට අට වසරකට උඩදී මවිසින් ආරම්භ කරණ ලද ජනවාර්ගික ප්‍රශ්නයට සාමකාමී සාකච්ජාමය විසඳුමක් ලබාදීමේ සාම ක්‍රියාදාමය

එක්සත් ජාතික පක්ෂයේ නව ආණ්ඩුවද ඉදිරියට ගෙනයාම ගැන මම අවංකවම සතුටට පත්වෙමි. ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර නොසන්සුන්තාව අඩුකිරීම සඳහා පසුගිය වසර තුළ ක්‍රියාත්මක කෙරුණු පියවර සතුටුදායක ලෙස ඉදිරියට යන බව පෙනේ. මූලික ප්‍රශ්න සම්බන්ධයෙන් එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීමේ අවශ්‍යතාව පිළිබඳව මා නිරන්තරයෙන් කළ යෝජනා කෙරෙහි ආණ්ඩුව බරපතල ලෙස සැලකිලිමත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට කමිටුවක් පත්කිරීමට තීරණය කොට තිබීම ගැන මම සතුටු වෙමි. අන්තර්වාර මණ්ඩලයක් පිහිටුවීම සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ.ය තවදුරටත් බල නොකරන බවක් පෙනීයාම ද යහපත් වර්ධනයකි. අන්තර්වාර මණ්ඩලයක් පිහිටුවීම පිළිබඳව සලකා බැලිය යුත්තේ ප්‍රධාන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කොට එකඟත්වයකට පැමිණීමෙන් පසුව හා අවි බිම තබා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට පිවිසීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය එකඟවීමෙන් පසුව පමණක්ය යනුවෙන් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පොදුජන එක්සත් පෙරමුණ ඇතුළු විපක්ෂයේ අනෙක් ප්‍රධාන පක්ෂ දරණ ස්ථාවරය මම තරයේ අනුමත කරමි.

අපගේ දැඩි සැලකිල්ලට හේතුවී ඇති ප්‍රශ්න නම් මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්නයි. ආණ්ඩුව හා එල්.ටී.ටී.ඊ සංවිධානය අතර සාකච්ඡාවල න්‍යාය පත්‍රයේ මෙම කාරණයට ඉහළම ප්‍රමුඛත්වය දිය යුතුය. ළමා සෙබළුන් බඳවාගැනීම, කප්පම් ගැනීම, උතුරු නැගෙනහිර මුස්ලිම් හා සිංහල ජනතාවගේ අයිතිවාසිකම් සහතික කිරීම හා බහුවිධ දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීම යන ප්‍රශ්නද න්‍යාය පත්‍රයට ඇතුළත් කළයුතුය. කාගේ අතින් සිදුවුවද මානව හිමිකම් කඩ වීමෙන් විපතට පත්වූවන්ට වන්දි ලබාදීමේ සුදුසු වැඩ පිළිවෙලක්ද සලකා බැලිය යුතුය. 1983 කළු ජූලියෙන් විපතට පත්වූවන් පිළිබඳව ද ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව මගින් තොරතුරු රැස්කොට ඇත. එහෙත් ඉන්පසුව ඇතිවූ ප්‍රචණ්ඩකාරී ක්‍රියා පිළිබඳව දැන් අප අවධානය යොමු කළයුතුය.

යුද ගැටුම් අවසන් කොට ගැටුමට තුඩුදුන් ප්‍රශ්නවලට සදාකාලික විසඳුම් සෙවීම සඳහා පැහැදිලි දැක්මක් තිබිය යුතු අතර ඒ පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු බව මම හැමවිටම අවධාරණය කොට ඇත්තෙමි.

මෙම අරමුණ පෙරදැරිව වාර්ගික සමගි සමාදානය සහ තිරසාර සාමය සඳහා ජාතික කමිටුවක් වහාම පිහිටවිය යුතුයැයි මම යෝජනා කරමි. මෙම කමිටුව ආණ්ඩුවේද, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවලද, ප්‍රධාන පෙළේ රාජ්‍ය නොවන සංවිධානවල සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයේද නියෝජිතයින්ගෙන් සමන්විත විය යුතුය. කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ -

- ගැටුමට හේතුවූ මූලික ප්‍රශ්න හඳුනා ගැනීම.
- එම ප්‍රශ්න වලට සාකච්ඡාමය විසඳුම් ලබාදීම. 1997 සහ 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් සාකච්ඡා සඳහා මෙහිදී පදනමක් කරගත හැකිය.
- උතුරු නැගෙනහිර මුස්ලිම් හා සිංහල ජනතාවගේ මෙන්ම සාමාන්‍ය දෙමළ ජනතාවගේ ආරක්ෂාව සහ සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

මා සඳහන් කරන යෝජනා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකාවේ ඉතාම හදිසි ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමට මං පෑදෙනු ඇතැයි මම විශ්වාස කරමි.

5. මෙම අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ප්‍රධාන දේශපාලන බලවේග පොදු ක්‍රියාකාරී සැලැස්මකට එකඟවිය යුතු අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාශීලී ලෙස සහභාගී විය යුතුය. මෙයට

සති කිපයකට උඩදී මා ජාතිය ඇමතූ අවස්ථාවේදී ද එවැනිම අදහසක් මම යෝජනා කලෙමි.

දැන් මම " **ජාතික සමගි සමාදානය පිණිස සන්ධානයක් සඳහා කමිටුවක්** " පිහිටුවිය යුතුයැයි යෝජනා කරමි. පාර්ලිමේන්තුව නියෝජනය කරන හා ඉන් පිටත සිටින සියලු දේශපාලන පක්ෂ හා කණ්ඩායම් වල නියෝජිතයින්ට මෙන්ම ජ්‍යෙෂ්ඨ ආගමික නායකයින්ට හා සමාජයේ වෙනත් නායකයින්ට ද මම මේ සඳහා ආරාධනය කරමි. කලින් සඳහන් කළ කර්තව්‍යයන් පහට අදාල ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ වගකීම මෙමෙ කමිටුවට පැවරේ.

අවසාන වශයෙන්, අමිහිරි අතීතය අමතක කරමු යැයි නැවත වරක් යෝජනා කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. අපේ දේශපාලන සංස්කෘතියේ විනාශයට හේතුවී ඇති පටු දේශපාලන කුලල්කාගැනීම් ඉවත දැමිය යුතුය. සියලුම ජනතාවන්ට අභිමානයෙන් හා සමාන අවස්ථා භුක්ති විඳිමින් ජීවත්විය හැකි වන පරිදි අපේ රට අපි යළි ගොඩනැගිය යුතු වෙමු.

අපේ රටේ මිනිසත් බව හා ප්‍රජාතන්ත්‍රවාදය යළි රජකරවීමේ මෙම උදාර සාමූහික කර්තව්‍ය සාර්ථක කරගනු සඳහා අපි සියළු දෙනා අත්වැල් බැඳගනිමුයි මම මගේ ජනතාවට හා ඔවුන්ගේ සියළු නායකයින්ට යෝජනා කරමි.

***ඔබ සැමට තෙරුවන් සරණයි !***
***වනක්කම්***
***අස්සලාම් අලෙයිකුම් !***

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023